


# අඳුරෙන් එළියට

(අංගුත්තර නිකායේ තමෝතම පරායන සූත්‍රය ඇසුරෙනි)




වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ ගරු යාවජීව සභාපති

වී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි




කාරුණික පින්වත්නි,

අද සම්මත වර්ෂ 2009 වසරේ ඇසළ පුර පසලොස්වක පොහෝ දිනයයි. වෙසක් පොහෝ දින සියලු කෙළෙසුන් නසා සර්වඥතා ඥාණය ලබාගත් අමා මෑණියන් වහන්සේ සතර ඉරියව් ගත කිරීම සඳහා සත් සති ගෙවා නැවත ධර්මය ආවර්ජනය කර ඇසළ පුර පෝය එලබෙත්ම බරණැස ඉසිපතන නම් වූ මහ වනයට වැඩම කොට පස්වග මහණුන් වහන්සේලාට ප්‍රථම ධර්ම දේශනය සිදු කළේ අද වැනි දිනකය. එමෙන්ම භික්ෂූන් වහන්සේ පෙරවස් සමාදන් වනුයේද මෙම පොහොය දිනයේමය.

පළමු ධර්ම දේශනාවෙන් බුද්ධත්වය යනු කුමක්දැයි ද එය ලබා ගතයුතු ආකාරයද එහි හරයද දේශනා කොට බුදුවරයෙකු ගේ ප්‍රඥාව ආකාර 05 කට වර්ග කොට චක්ඛුං උදපාදි (ඇස පහළ විය), ඤාණං උදපාදි (ඤාණය පහළ විය), පඤ්ඤා උදපාදි (ප්‍රඥාව පහළ විය), විජ්ජා උදපාදි (දැනුම පහළ විය), ආලෝකෝ උදපාදි (ආලෝකය පහළ විය),

01. **සත්‍ය ඤාණ චක්ෂුසය හෙවත් ප්‍රඥා ඇස පහළ වීමයි.**

02. **ලෝකය පිළිබඳ තත්වාර්ථ ඤාණය වූ ඇති තතු අවබෝධ විය.**

03. **ප්‍රකාර වශයෙන් ප්‍රභේද වශයෙන් අවබෝධ වූ ප්‍රඥාව පහළ විය.**

04. **කෙළෙස් භේදනය කරන දැනීම හෙවත් විද්‍යාව පහළ විය.**

**05. සත්‍ය සම්පාදනය කරන මෝහන්ධකාරය නැති කරන ආලෝකය පහළ විය.**

ඉහතින් දැක්වූයේ බුදුරජාණන් වහන්සේගේ බුදු නුවණ හෙවත් සර්වඥතා ඥාණය, ලෝකයේ ඇති වන්නාවූ ආලෝක අතරින් අග්‍රවන ආලෝකය බවට ආකාර 05 කින් දැක්වීමයි.

මෙම ධර්ම පත්‍රිකාවෙන් අප බලාපොරොත්තු වන්නේ බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥාව නැමැති ආලෝකයෙන් අප ජීවිතයන්ද ආලෝකය කරා ගමන් කරවීමට අනුශාසනය ලබා ගැනීමයි. එම අනුශාසනය සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ මචල වර්ගයේ එන තමෝතම පරායන සූත්‍රයේ විස්තරවේ. ඒ අනුව ආලෝකය සහ අඳුර තේරුම් ගෙන අඳුරු පටලය ඉරා ආලෝකය කරා ගමන් කරමු.

ජේතවනාරාමයේ වැඩ වසන බුදු හිමියන් දිනක් භික්ෂූන් වහන්සේ අමතා "මහණෙනි පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයේ විද්‍යමාන වෙති, කවර සතර දෙනෙක්ද යත් ගිහි ජීවිතයටද කර්ම ශක්තිය ආලෝකයක් විය යුතු බවට මෙම සූත්‍රය තහවුරු කරයි. ආලෝකය යනු පුණ්‍යකර්ම විපාකයයි. අන්ධකාරය යනු පාප කර්ම විපාකයයි. තවත් ලෙසකින් හඳුන්වන්නේ නම් ප්‍රඥාව සහ මෝහයයි.

**මානෙන් ඉඳිතත් මේ සැප පෙ රූමය**

**සීනෙන් ගෑ සුවදක් සේ බො රූමය**

**දානෙන් සීලෙන් නොකළොත් ද රූමය**

**පානෙන් අඳුරට ගෙනයයි ක රූමය**

යනුවෙන් ලෝ වැඩ සඟරා කතුවරයා මේ සැපය උතුම් යැයි සලකා මානෙන් සිටියත් සිහිනෙන් ගෑ සුවදක් මෙන් මායාවකි දානයෙන් හා සීලයෙන් ගුණදම් නොපිරුවොත් හෙවත් නොකෙළේ නම් පාප කර්මය විසින් සත්වයා ආලෝකයෙන් අන්ධකාරයට ගෙන යන්නේය. යනුවෙන් ප්‍රකාශිත වන්නේද මෙයයි.

"සුමණාවෙනි, දන් දීම, සුදුසුමය, පින් කිරීම කළ යුතුමය. දෙවියෙක් වුවද මනුෂ්‍යයෙක් වුවද පැවිද්දෙක් වුවද ඒකාන්තයෙන් පින උපකාරවේ."

දේව භූතස්සපි උපකාරනි පුඤ්ඤදානි (දෙවියන්ටද පින උපකාරීවේ.), මනුස්ස භූතස්සපි උපකාරානි පුඤ්ඤදානි, (මනුෂ්‍යයාටද පින උපකාරීවේ.), පබ්බජිතස්සපි උපකාරානි පුඤ්ඤදානි (පැවිදිවූ වහුටද පින උපකාරනිවේ.), යනුවෙන් අංගුත්තර නිකායේ සුමනා සූත්‍රයෙන් ඉගැන්වේ.

මාතෘකා කළ තමෝ තම පරායන සූත්‍රයට අනුව අඳුරෙන් අඳුරට (මෝහයෙන් මෝහයට) එළියෙන් එළියට (ප්‍රඥාවෙන් ප්‍රඥාවට) යන ධර්ම පර්යායට අනුව සමාජගතව ජීවත්වන සියලු දෙනාටම ප්‍රායෝගිකව පිවිසිය හැකිය. යම් සත්වයෙක් නිවන් දකින තුරු අඳුර සහ ආලෝකය ඔහුගේ වාසස්ථානය වේ. ලෝකයේ වැඩි දෙනෙකුගේ වාසස්ථානය වන්නේ අඳුරය. එබැවින් තථාගතයන් වහන්සේ ලොව පවතින ආලොක හතරක් වදාළහ.

1. **සඳෙහි ආලෝකය**
2. **සූර්යපා ලෝකය**
3. **ගින්නෙහි ආලෝකය**
4. **ප්‍රඥා ලෝකය**

යනුවෙන් ප්‍රඥා ලෝකයම අග්‍රවන බව වදාළහ. එයින්ද බුදුවරයෙකුගේ ප්‍රඥා ආලෝකයේ ධාරිතාවය සියලු ආලෝකයන් පරදන බව දේශනා කොට ඇත.

සමාජයේ ජීවත්වෙන සියලු සත්වයින් අතින් සිත, කය, වචනය යන තුන් දොරින් ක්‍රියා හෙවත් කර්ම සිදුවේ. මේවා පින් පව් වශයෙන් මෙලොවටද පරලොවටද හේතු විපාක දේ. එයින් ආලෝකය හෙවත් සුගතියද අඳුර හෙවත් දුගතියද ලබාදේ. ඒ බව හොඳින් තහවුරු කළ තැනකි දස දම්ම සූත්‍රය. ''මා විසින් යම් කර්මයක් කළේද ඒ කර්මය විසින් දෙන ලද විපාකද මට අයත් වෙමි. කර්ම දායාද වේ. කර්ම උපතට හේතු ලබාදේ. කර්මය නෑදෑයාද වේ. කර්මයම පිහිට කොට ඇත. හොඳ හෝ නරක කර්මයක් මම කරන ලද්දෙම්ද හොඳ සේ නරක විපාක මටම අයත්ය. මා විසින් විඳිය යුතුමය.'' මෙම ධර්ම න්‍යාය ලෝකයේ වෙනත් ශාස්තෘවරයෙකු පෙන්වා දී නැත. තම වාසියට, ලාභයට, පහසුවට යොදාගත් කර්ම ධර්ම න්‍යායන් බහුලව අසන්නට ඇත. මේ අතර බෞද්ධයන්ද පුරුදු වී සිටින්නේ දිව්‍ය ලෝකයත් සතර අපාය ආදී දුගතීන්ද

මෙලොවම පවතින බවයි. භෞතික සම්පත් වලින් පිරි විදේශ රටක සැප සම්පත් විඳ සහ දැක පැමිණි අය දිව්‍ය ලෝකය තිබෙන්නේ අහවල් රටේ යයි කියන අවස්ථා ඇත. හැම ආගකම උගන්වන්නේ එකම දෙයක් යැයිද පන්සලේ කෝවිලේ පල්ලියේ දැල්වෙනුයේ එකම පහණ යයි කියා බුදු දහමද ඒ මල්ලට දමා සොලවන්නන්ද සිටී. එසේ වන්නේ ලොව්තුරා ධර්මයේ ඉගැන්වෙන බුද්ධ විෂය කර්ම විෂය, ධර්ම විෂය, ලෝක විෂය, චිත්ත විෂය පිළිබඳව සහ එහි ඇති සංකීර්ණ භාවය නොදන්නාකම නිසාය. ඇතැම් ආගමකට අනුව තමන්ට මරාගෙන කෑම කළ යුතු නිසා එවැනි සතුන්ට දෙවියන් වහන්සේ ප්‍රාණය ඇති කර තිබෙන්නේ නරක්වීම වැලැක්වීමට යැයි කියති. එම සතා මරාගෙන කන තමන්ද නරක් නොවී සිටින්නේ පණ තිබෙන නිසා බව ඔහු නොදනී. එය තේරුම් ගැනීමට බැරි කෙනෙකුට කර්මය පිළිබඳ සූත්‍රවෙන්

01. අඳුරෙන් අඳුරට යන

02. අඳුරෙන් ආලෝකයට යන

03. ආලෝකයෙන් අඳුරට යන

04. ආලෝකයෙන් ආලෝකයට යන වශයෙන් මේ පුද්ගලයෝ සතර දෙනාය.

### අඳුරෙන් අඳුරට යන්නා (තමෝ තම පරායන)

සූත්‍රයේ දක්වන පුද්ගලයන් සතර දෙනාගෙන් පළමු පුද්ගලයා අඳුරෙන් අඳුරට යන්නා ලෙස දැක්වේ. මෙලොව ඇතැම් පුද්ගලයෙක් ඉතා දුප්පත්ව ආහාර පානාදියෙන් අඩු පහසුකම් ඇතිව ඉතා දුක්ඛිත ජීවිතයක් පවත්වමින් ඉතා අපහසුවෙන් ආහාර වස්ත්‍ර ආදිය සොයා ගනිමින් පහත් යැයි සම්මත කුලයකද ඉපිද රූප සම්පත්තියෙන් අඩු පාඩු සහිතව අංග විකලව ඉතා අභාග්‍ය සම්පන්නව එම සියලු දුක් විඳිමින් ජීවත් වන අතර කයින් දුශ්චරිත කරමින් (ප්‍රාණඝාතය, සොරකම, කාමෙහි වරදවා හැසිරීම ආදී වූ පාප ක්‍රියා) වචනයෙන් දුශ්චරිත කරමින් (බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම ආදී පාප ක්‍රියා) සිතින් දුශ්චරිත කරමින් (ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය ආදී පාප ක්‍රියා) ජීවත් වී මරණින් මතු සැපෙන් තොරවූ නපුරු ගති ඇති නිරා දුකට පැමිණේ මෙවැනි පුද්ගලයා අඳුරෙන් අඳුරට යන්නා වේ.

### අඳුරෙන් ආලෝකයට යන්නා (තමෝ ජෝති පරායන)

සූත්‍රයේ දැක්වෙන දෙවෙනි පුද්ගලයා මෙලොව දිළිඳුව ඉපිද ආහාර පානාදියෙන් අඩු පාඩු සහිතව දුක්ඛිත ජීවිතයක් පවත්වමින් පහත් කුලයක ඉපිද රූප සම්පත්තියද හරි හැටි නොපිහිටා අංග විකල භාවයෙන්ද සැපෙන්ද පිරිහී ජීවත් වන අතර තිදොරින් හෙවත් සිතින්, කයින්, වචනයෙන් සුචරිත කොට ජීවිතය පවත්වා සොම්නස් සහගතව මරණින් මතු යහපත් වූ ස්වර්ගයට පැමිණේ. ඒ පුද්ගලයා අඳුරෙන් ආලෝකයට යන්නා ලෙසින් දැක්වේ.

### ආලෝකයෙන් අඳුරට යන්නා (ජෝති තම පරායන)

මෙම සූත්‍රයේ දැක්වෙන ලෝකයේ විද්‍යාමාන වන තෙවෙනි පුද්ගලයා ලෙසට බුදුරජාණන් වහන්සේ දකින්නේ මහා ධන කුවේරයන් වී මහත් භෝග ඇතිව රන් රිදී උපභෝග පරිභෝග වස්තු ඇති උසස් යයි සම්මත කුලයන්හි ඉපිද එපමණක් නොව අභිරූපීව (අතිශයින් රූපසම්පන්නව) ප්‍රසාද ජනකව දර්ශනීයව ජීවත් වෙමින් සිතින් කයින් වචනයෙන් දුශ්චරිත ක්‍රියා කරයි එම පාප කර්ම හේතු කොට ගෙන යහපත් සැප ඉසුරු ඇති එම පුද්ගලයා මරණින් මතු නපුරු ගති ඇති නිරාදුක් සහිත නිරයට එළඹෙයි. මෙසේ ආලෝකයෙන් අඳුරට යන්නා දැක්වේ.

### ආලෝකයෙන් ආලෝකයට යන්නා (ජෝති ජෝති පරායන)

බුදුරජාණන් වහන්සේ දක්වන සිව්වෙනි පුද්ගලයා තෙමේ මහත් වූ ධනයද මහා භෝගයන්ද රන් රිදී උපභෝග පරිභෝග වස්තුවෙන්ද පරිපූර්ණව බමුණු මහා සාර ක්ෂත්‍රිය මහා සාර කුලයෙහි වේවා උසස් යැයි සම්මත කුලයෙහි ඉපිද ඉතා ශෝභන ශරීරයකින් දර්ශනීයවද ප්‍රසාද ජනකවද ඉපිද එම සැප විඳින අතර කයින් වචනයෙන් සිතින් සුචරිතවත්ව ජීවත්වී මරණින් මත්තෙහිද ශෝභන ගති ඇති ස්වර්ග ලෝකයට එළඹේ. ඒ ආලෝකයෙන් ආලෝකයට ගමන් කරන්නාය.

මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි දකින්ට ලැබේ යැයි තථාගතයන් වහන්සේ වදාලහ. උන්වහන්සේ මෙම සූත්‍රයෙන් ගිහි පැවිදි දෙපාර්ශවයටම පෙන්වා දෙනුයේ ලෝකයේ කවදත් දකින්නට ලැබෙන ලක්ෂණ හතරකි. මෙයින් නිවැරදි වූද සුවදායක වූද අර්ථ සහිත ස්ථානය ලෙසට ආලෝකයට පැමිණීමට මඟ පෙන්වයි. පස්වග මහණුන් වහන්සේලාට "ආලෝකෝ උපාදි" යනුවෙන් ආලෝකය පහළ උනා යයි

පැහැදිලි කළේද මෙයයි. ගිහි පැවිදි හැමටම මෙම මාර්ග සංඥාව සාධාරණ වේ. පැවිදි ජීවිතයටද හෝ තේරුම් ගැනීමට නොහැක. ඒ ධර්මය නොව අධර්මයයි. කුමන තරාතිරමක කෙනෙක් වුවද ගතවන නිමේශයේ වැඩ වරද්දා ගැනීම සහ වැඩ නොවරද්දා ගැනීම තුලින් තමන්ගේ අඳුර සහ ආලෝකයට හේතු වන බව නොදනී.

ජීවිත කඩඉම් වශයෙන් ගත්කල ඉගෙන ගන්නා කාලය, තරුණ කාලය, මැදවිය සහ වැඩිහිටි කාලය වශයෙන් වෙන් වන අප ජීවිත පරිච්ජේද තුලින් ඊට සරිලන කමී සිදුකර ගත යුතුයි. ශිෂ්‍ය ජීවිතයේ ආලෝකය තරුණ ජීවිතයටද තරුණ ජීවිතයේ ආලෝකය පරිණත මැදිවියටද මැදිවියේ ආලෝකය වෘද්ධ වියටද එම ආලෝකය සසරටද දල්වන්නේ නම් මෙලොව සහ පරලොව ආලෝකමත් වේ. මේ ආකාරයෙන් අඳුර ක්‍රියාත්මක කරන්නේ නම් දෙලොවම අන්ධකාරයේ ගිලේ.

සමාජයේ යමෙක් සැප සම්පත් ඇතිව ජීවත්වෙද්දී එයින් උඩඟුව තමා ලොක්කෙකු බැව් සිතා උඩගු වී ඒ සියලු සම්පත්වලින් කවදා හෝ වෙන් වන්නට සිදුවන බැවින් සිහිනෙන් ගෑ සුවඳක් වූ මායාවක් බව නොදැන ගුණ ධර්‍ම අමතක කොට ඇඳුමෙන් පැලඳුමෙන් අනෙකුත් බාහිර දෙයින්ද තිදොරින් දුශ්චරිතයෙන්ද දූෂිතව බොහෝ අකුසල් කොට පරලොව දුගතිගාමීවේ. ආලෝකයෙන් අඳුරට යති. ගුණ ධර්‍මයෙන් හා සැප සම්පතින් පිරිහීම අඳුර වේ. ගුණ ධර්‍මයෙන් හා සැපසම්පත්වලින් සම්පූර්ණවීම ආලෝකය වේ. මේ දෙකටම හේතු වන්නේ. ප්‍රඥාව සහ මෝහ යයි. ආලෝකය ඇති කිරීම අපහසුය. අන්ධකාරය ඇති කිරීම පහසුය. එය ලෝක ස්වභාවයයි. ඒ අනුව සිල්පද වලින් එකක් හෝ අඩු කිරීමට පනතක් සම්මත කරගැනීමට හැකි නම් එසේ කිරීමට මැලි නොවන අයද මතුවට පහළ වෙන්නට බැරි නැත.

මේ ආකාරයෙන් සමාජගත විවිධ ක්ෂේත්‍රයනට ආලෝකය හෙවත් පහණෙහි උපමාව ඉතා වැදගත් වේ. දැල්වූ පහණ නිවාදමන්නන්සේ දෙමාපියන් දායාද කල ගුණ ධර්‍මද නැති කරන ඇතැම් දරුවෝ මෙන් ආලෝකයෙන් අඳුරට යන්නා සේ මුලු සමාජ ව්‍යුහයම මෙම ක්‍රියා දාමය තේරුම් ගන්නේ නම් ආලෝකයෙන් ආලෝකයට පිවිසේ.

අප විසින් "තිලෝකදීපං සම්බුද්ධං" යනුවෙන් හඳුන්වා දැල්වූ පහණක් ඉදිරියේ බුදු ගුණ සිහිපත් කරණුයේ ප්‍රතිමා වහන්සේ අඳුරෙහි වැඩ සිටීමම නිසා නොව

උන්වහන්සේගේ ප්‍රඥාලෝකයේ ආධාරයෙන් අප හැමගේ අවිද්‍යා අන්ධකාරය දුරු කර ගැනීමට හේතුවන සංකේතය නිසාය. අඩුම තරමින් ප්‍රාණඝාතය අදත්තාදානය, (සොරකම) කාමමිත්‍යා චාරය, මුසාවාදය, රහමෙර පානය යන පස් පවින් වැලකීම පහන් පූජා කිරීමට සුදුස්සෙක් බව තේරුම් ගත යුත්තේ  ප්‍රතිමා වහන්සේ ඉදිරියේ පහන් කොතරම් දැල්වුවද සදාකාලිකව තමන් අඳුරේ බව නොදැනීමෙන්ය. ඒ අඳුර නැති කිරීමට තුන් ලොවට ප්‍රදීපයක් වූ බුදුරජාණන් වහන්සේගේ ධර්මය  තුල නිසි පරිදි හැසිරීමට අදින් ආරම්භවන වස් කාලය තුලදී විමසා ඉගෙන  ගනිමු.

lakruhunu@gmail.com
www.lakruhunu.com